ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ("මණ්ඩලය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගත් විගණන සාක්ෂි මත මාගේ නිගමන පදනම් වී ඇත. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව මණ්ඩලය කටයුතු කර ඇති බව,

- මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වත්කම් වර්ගීකරණය සහ ප්‍රදානය හඳුනා ගැනීම සම්බන්ධ අභ්‍යන්තර පාලනයන්හි දුර්වලතාවය හේතුවෙන් 2012 වර්ෂයේ සිට සෑම වර්ෂයකම වත්කම් සහ ක්ෂයවීම් සඳහා පෙර වර්ෂ ගැලපීම් සිදු කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වර්ෂයේ ආරම්භක සමුච්චිත ලාභය සහ පෙර වර්ෂයේ ලාභය පිළිවෙලින් රු. මිලියන 3,576 කින් සහ රු. මිලියන 51.93 කින් වෙනස් කර තිබුණි.	පෙර වර්ෂවලට අදාළ වත්කම් වර්ගීකරණය සහ ප්‍රදාන ක්‍රමක්ෂය වැරදි එල්.කේ.ඒ.එස් 08 ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර ඇත. තවද, වත්කම් ප්‍රාග්ධනිත කිරීමේදී නිවැරදි වත්කම් කාණ්ඩය සහ අදාළ අරමුදල් ප්‍රභවයන් පරීක්ෂා කර හඳුනා ගැනීමට ප්‍රාදේශිකවලට උපදෙස් දෙන ලදි.	පෙර වර්ෂ ගැලපීම් අවම කිරීම සඳහා අභ්‍යන්තර පාලනයන් හඳුන්වා දීම සහ වත්කම් පිළිබඳ නිවැරදි වාර්තා පවත්වා ගැනීම සඳහා ප්‍රාග්ධනීකරණ පද්ධතිය විධිමත් කළ යුතුය.

1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත එල්.කේ.ඒ.එස් 16 හි 51 වන වගන්තිය ප්‍රකාරව, මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන ස්ථාවර වත්කම් කාණ්ඩ 16 කට අයත් වටිනාකම රු.මිලියන 3,990 ක් වන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල ඵලදායී ජීවිත කාලය සංශෝධනය කිරීම සඳහා වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි.	එල්.කේ.ඒ.එස් 16 හි 51 වන වගන්තිය අනුව, රට පුරා විසිරී ඇති අතිවිශාල වත්කම් පදනමක් සහ මණ්ඩලයට විශේෂිත වූ සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් පවතින බැවින්, මණ්ඩලයේ වත්කම් පදනම තක්සේරු කිරීම ප්‍රායෝගික නොවේ. කෙසේ වෙතත්, තාක්ෂණික කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් ස්ථාවර වත්කම්වල ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය සමාලෝචනය කරනු ලබන අතර ඒ	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත එල්.කේ.ඒ.එස් 16 අනුව ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය සංශෝධනය කිරීම සඳහා වත්කම් වාර්ෂිකව සමාලෝචනය කළ යුතුය.

		අනුව ක්ෂයවීම් සඳහා අවශ්‍ය සංශෝධන සිදු කරනු ඇත.	
(ආ)	ගිණුම්කරණ ප්‍රතිපත්තියට පටහැනිව, මලාපවහන සහ අනෙකුත් ණයගැතියන්ගේ හානිකරණ ගණනය කිරීම සඳහා අපේක්ෂිත ණය අලාභ ක්‍රමය වෙනුවට ස්ථාවර අනුපාතයක් භාවිතා කර තිබුණි. විගණකගේ ගණනය කිරීමට අනුව, මලාපවහන සහ අනෙකුත් ණයගැතියන්ගේ හානිකරණ සඳහා ප්‍රතිපාදන ආසන්න වශයෙන් රු. මිලියන 67.46 කින් අඩුවෙන් දක්වා තිබුණි.	මෙය වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු ශේෂයෙන් සියයට 4.3 ක් නියෝජනය කරන අතර මෙම ශේෂයන් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා ඇත. එබැවින්, එස්.එල්.එෆ්.ආර්.එස් 09 හි අපේක්ෂිත ණය අලාභ ක්‍රමය යෙදීමෙන් මෙම ශේෂයට සැලකිය යුතු වෙනසක් සිදු නොකරනු ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 09 ට අනුකූලව ණයගැතියන්ගේ හානිකරණ ගණනය ණය අලාභ ක්‍රමයට ගණනය කළ යුතුය.
(ඇ)	කල්බදු පිළිබඳ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 හි 51 වැනි වගන්තියේ අවශ්‍යතාවයට අනුව භාවිත අයිතිය සතු වත්කම් ලෙස අනාවරණය කිරීමෙන් තොරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් තුළ සින්නක්කර ඉඩම් යටතේ කල්බදු ඉඩම ලෙස රු. මිලියන 669.74 ක් වටිනා කල්බදු වත්කම් අනාවරණය කර තිබුණි. තවද, කල්බදු කාල සීමාව තුළ භාවිත අයිතිය සතු වත්කම්වල ක්ෂයවීම් මණ්ඩලය විසින් ගිණුම්ගත කර නොතිබූ අතර වත්කම් සම්බන්ධව සාක්ෂි නොමැති වීම හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට ක්ෂයවීම්වලට එමඟින් සිදු කර ඇති බලපෑම තහවුරු කර ගත නොහැකි විය.	කල්බදු ඉඩම් කිහිපයක් සඳහා අදාළ බලධාරීන් සමඟ කල්බදු ගිවිසුම් නොතිබුණි. එබැවින්, එස්.එල්.එෆ්.ආර්.එස් 16 (කල්බදු) හි අවශ්‍යතාවයට අනුව වත්මන් ගිණුම්කරණ ක්‍රමවේදය දිගටම කරගෙන යන ලදි.	අදාළ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව කල්බදු ඉඩම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු අතර ඊට අදාළ ක්ෂය නිවැරදිව ගණනය කල යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව 2023 වර්ෂයේ ආදායම් ප්‍රකාශන නැවත ප්‍රකාශ කිරීම වෙනුවට හඳුනාගත් සහ ඉවත් කරන ලද වත්කම්, වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු මුදල්, තොග සහ ප්‍රාග්ධන ප්‍රදාන මත පිළිවෙලින් රු. 216,708,371 ක්, රු. 5,561,212 ක්, රු. 67,219 ක් සහ රු. 630,078 ක් වූ ගනුදෙනු ස්කන්ධ ප්‍රකාශනවල සමුච්චිත ලාභයට හඳුනාගෙන තිබුණි.	පෙර වර්ෂ ගැලපීම්වල සංකීර්ණතාවය නිසා, නැවත සකස් කරන වියදම් කාණ්ඩය හඳුනා ගැනීම ඉතා අපහසුය. වැරදි වර්ගීකරණයක් ආදායම් ප්‍රකාශනයේ සාධාරණ ඉදිරිපත් කිරීම නොමඟ යැවිය හැකි බැවින්, ඒවා පෙර වර්ෂ ගැලපීම් ලෙස ස්කන්ධ ප්‍රකාශනයේ ගැලපීම් කරන ලදි.	මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සිදුවන වැරදි වලක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කල යුතුය.
(ඉ)	රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශවල අවශ්‍යතාවයට අනුව, සම්බන්ධිත	අනාගත වාර්තාකරණ කාල පරිච්ඡේදවලදී සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හඳුනා ගැනීම සහ සමාලෝචනය කිරීම සඳහා ඵලදායී	සම්බන්ධිත පාර්ශව ගනුදෙනු හඳුනාගැනීමේ

	පාර්ශව ගනුදෙනු හඳුනාගැනීමේ ක්‍රමවේදයක්, එම ක්‍රියා පටිපාටියේ ඵලදායීතාවය සමාලෝචනය කිරීමට සහ සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පාර්ශ්වකරුවන්ට වාර්තා කිරීමට මණ්ඩලය විසින් ස්ථාපිත කර නොතිබුණි.	ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පියවර ක්‍රියාත්මක කරනු ඇත.	ක්‍රමවේදයක් සකස් කළ යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත එල්.කේ.ඒ.එස් 20 විධිවිධානවලට පටහැනිව, 2024 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 26 කට අදාළව එකතුව රු. මිලියන 7,004 ක සහ එක් ව්‍යාපෘතියකට අදාළව රු. මිලියන 334.53 ක විදේශ ප්‍රදාන ශේෂයන් පිළිවෙලින් වසර 16 කට සහ වසර 13 කට වැඩි කාලයක් තිස්සේ ක්‍රමක්ෂය කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල පැවතුනි.	විගණන සහ කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු, 1999 වර්ෂයට පෙර රැස් කරගත් ප්‍රදානවල ශේෂයන්, වත්කම් කාණ්ඩවල සාමාන්‍ය ඵලදායී ජීවිත කාලය මත පදනම්ව ක්‍රමක්ෂය කරනු ඇත.	අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූලව ලද විදේශීය ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතුය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පිරිවැය මධ්‍යස්ථාන තිහක, රු. මිලියන 929.54 ක මුළු වටිනාකමක් සහිත ස්ථාවර වත්කම් සත්‍යාපනය කළ නොහැකි වූ අතර භෞතිකව නොපැවතුනි. විගණනයට ඉදිරිපත් කරන ලද සත්‍යාපන වාර්තාවලට අනුව, ප්‍රාදේශීය සහයක මධ්‍යස්ථානවල රු. මිලියන 291.87 ක් වටිනා වත්කම් පැහැදිලිව හඳුනාගත නොහැකි විය. කෙසේ වෙතත්, 102 සිට 105 දක්වා වූ මූල්‍ය රෙගුලාසිවල විධිවිධානවලට අනුව ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය තුළදී ක්ෂයවීම් සඳහා රු. මිලියන 89 ක ප්‍රතිපාදන ගිණුම්ගත කර තිබුණි. තවද, මෙම නොපවතින වත්කම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල හානිකරණ ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි.	අභ්‍යන්තර තොග මාරු කිරීමේ සටහන භාවිතා කිරීමෙන් තොරව ඇතැම් වත්කම් මාරු කර ඇත. භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව මත පදනම්ව අනෙකුත් වත්කම් අපහරණය කිරීමට කටයුතු සිදු කරමින් පවතී.	අනිසි භාවිතයන් සහ අස්ථානගතවීම් වළක්වා ගැනීම සඳහා වත්කම් කළමනාකරණය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.

(ආ)	ව්‍යාපෘති සඳහා ලද රු. මිලියන 29,487.70 ක් වූ රජයේ ප්‍රදාන, විදේශ ප්‍රදාන සහ දේශීය ප්‍රදාන වර්ෂ හතරකට වැඩි කාලයක් තිස්සේ ක්‍රමක්ෂය කිරීමකින් තොරව පැවතුනු අතර විගණනයට තොරතුරු ඉදිරිපත් කර නොමැති බැවින් මූල්‍ය ප්‍රකාශනවලට ක්‍රමක්ෂය නොකිරීමේ බලපෑම විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.	ප්‍රාග්ධනිතකරණ ක්‍රියාපටිපාටිය අවසන් වූ පසු, සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවලට අදාළ ප්‍රදාන ක්‍රමක්ෂය කරනු ඇත.	අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්හි විධිවිධානවලට අනුකූලව ලද ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සටහන් අංක 3.2.2 අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේ තොග ශේෂය හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අගය කළ යුතුය. කෙසේ වෙතත්, තොග ලැබීම් සහ නිකුත් කිරීම් අතර අසාමාන්‍ය මිල විචලනයන් හේතුවෙන් කළමනාකරණ තොරතුරු පද්ධතියෙන් ලබාගත් තොග ශේෂය හරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අනුකූල නොවන බව නියදි විගණන පරීක්‍ෂණයෙන් අනාවරණය විය. සමාලෝචිත වර්ෂය තුළදී තොග ගැලපුම් ලෙස තොග වටිනාකමින් රු. මිලියන 171.99 ක් වූ අසාමාන්‍ය මිල විචලනයන් අඩු කර තිබුණි. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල තොග ශේෂයේ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.	තොග ගැලපුම් ගිණුමට ඇතුළත් කර ඇති 2021 සිට 2023 දක්වා කාලය සඳහා මුළු මිල විචලනය රු. 258,090,926 ක් විය. මෙය 2025 වර්ෂය තුළ නිරවුල් කරන ලදී. ඒ අනුව, රු. 86,096,803 ක ප්‍රමාණ විචලන මුදල තොග ගැලපුම් ගිණුමේ පැවතුනි. තොග හිඟයන්ට අදාළ සවිස්තරාත්මක විමර්ශන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීගේ (කාර්මික සබඳතා) විෂය පථය යටතේ සිදුකරමින් පවතින අතර, නිර්දේශ මත පදනම්ව ශේෂයන් අයකර ගැනීම සිදු කරනු ඇත.	අසාමාන්‍ය මිල විචලනයන් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	උපචිත පොලිය සම්බන්ධයෙන් බැංකුවලින් විගණකට සෘජුවම ලද තහවුරු කිරීම් හා සසඳන විට, විදේශ අරමුදල් සපයන ලද එක් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 694 ක් අඩුවෙන් ප්‍රතිපාදන ගිණුම්ගත කර තිබුණි. එබැවින්, කෙරීගෙන යන වැඩ ශේෂය එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි. ඊට අමතරව, බැංකුව විසින් විගණකට සහ මණ්ඩලයට තහවුරු කරන ලද ශේෂවල වෙනස හේතුවෙන් උපචිත පොලිය සඳහා මණ්ඩලය විසින් එහි මූල්‍ය ප්‍රකාශනවල රු. මිලියන 166 ක් අඩුවෙන් ප්‍රතිපාදන ගිණුම්ගත කර තිබුණි.	අදාළ බැංකුවලින් ලද පොලී ගෙවීම් නිවේදනයට අනුව උපචිත පොලිය ගිණුම්ගත කර ඇති අතර ඒ අනුව පොලිය ගෙවා ඇත. දඩ පොලිය ගෙවා නොමැති බැවින්, දඩ පොලියකින් තොරව පොලී ප්‍රතිපාදන සලසා ඇත. එබැවින්, මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් හෝ අඩුවෙන් ප්‍රතිපාදන සලසා නොමැත.	හොඳම ඇස්තමේන්තු මත ප්‍රතිපාදන සැලසිය යුතුය.

(ඉ)	ලද තොරතුරුවලට අනුව, පිරිවැය රු. මිලියන 20,790 ක් වූ නිම කරන ලද සහ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති (ඉදිකිරීම් සහ පුනරුත්ථාපන) අසූ නවයක් 2024 දෙසැම්බර් 31 වන දිනට ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ ගිණුමේ පැවතුනි. එබැවින්, දේපල, පිරියත හා උපකරණ සහ වර්ෂයට අදාළ ක්ෂයවීම් අඩුවෙන් දක්වා තිබුණි.	සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති ප්‍රාග්ධනීකරණය කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය සහායක මධ්‍යස්ථාන/කලාප සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීමෙන් ප්‍රාග්ධනිතකරණ ක්‍රියා පටිපාටිය කඩිනම් කිරීමට අපේක්ෂා කෙරේ.	ප්‍රාග්ධනිතකරණ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය.
(ඊ)	පැවැත්මට හේතු හඳුනා ගැනීමෙන් තොරව වත්කම් සහ වගකීම් පිළිවෙලින් රු. මිලියන 149.75 ක් සහ රු. මිලියන 51 ක් මූල්‍ය ප්‍රකාශනවල මෙහෙයුම් නොවන වත්කම් සහ මෙහෙයුම් නොවන වගකීම් ලෙස දීර්ඝ කාලයක් තිස්සේ පවතී. තවද, රු. මිලියන 235 ක හඳුනා නොගත් පෙර වර්ෂ ශේෂයක්, රු. මිලියන 22 ක තොග ශේෂයක්, රු. මිලියන 8 ක බැංකු ශේෂයක් සහ අමාත්‍යාංශයට ලබා දී ඇති රු. මිලියන 15 ක අත්තිකාරමක් මෙහෙයුම් නොවන වත්කම් ලෙස ඉහත ශේෂයට ඇතුළත් කර තිබුණි.	අතින් ලබාගත් දත්ත පරිගණකගත පද්ධතියට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලියේදී මෙම ශේෂයන්ගෙන් බහුතරයක් ඇති විය. ශේෂයන් හඳුනාගෙන සැසඳීම සඳහා කමිටු කිහිපයක් පත් කර තිබුණද, සහායක ලියකියවිලි නොමැතිකම නිසා සම්පූර්ණ විසඳුමක් නොලැබුණි. මෙම ශේෂයන් නිරවුල් කිරීම සඳහා ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදුකරමින් පවතින අතර 2025 වර්ෂයේදී නිරවුල් කරනු ඇත.	පවතින ශේෂය නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර අනාගතයේදී මෙවැනි ශේෂයන් ජනනය වීම වැළැක්වීම සඳහා පද්ධතියක් හඳුන්වා දිය යුතුය.
(උ)	වත්කම්වල වටිනාකම තක්සේරු කරමින් ගොඩනැගිල්ලක්, කැබ් රථයක්, ඉඩම් පහක් සහ කල්බදු ඉඩමක් ගිණුම්ගත කිරීම සහ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීම සිදු කර නොතිබුණි.	එම වත්කම් ප්‍රාග්ධනිත කර හැකි ඉක්මනින් වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට පියවර ගනු ඇත.	පවරා ගැනීමේදී වත්කම් වාර්තා කිරීමට පියවර ගත යුතුය.
(ඌ)	ආයෝජන පොලී ආදායමෙන්, ගිලන් අරමුදලට සේවක දායකත්වයෙන් සහ ආයතනික සමාජ වගකීම් (CSR) අරමුදලට වැටුප් දායකත්වයෙන් ලද එකතුව රු. මිලියන 8.47 ක් ප්‍රධාන මෙහෙයුම්වලින් ලද ආදායම් ලෙස වැරදි ලෙස ඉදිරිපත් කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.	ආයෝජනය සඳහා පොලී ආදායමෙන් ලැබෙන ලැබීම්, ගිලන් අරමුදල සඳහා සේවක දායකත්වය සහ CSR අරමුදලට වැටුප් දායකත්වය පිළිවෙලින් ප්‍රධාන මෙහෙයුම්වලින් ලද ආදායම ලෙස ඉදිරිපත් කර තිබුණි. මෙම ආදායම් සුභසාධන සමිති අරමුදලට සහ ගිලන් අරමුදල් ගිණුම් වෙත මාරු කරන ලදි. මෙම අරමුදල් දෙක ස්කන්ධ සංචිත ලෙස හඳුනාගෙන ඇති බැවින්, මෙම අරමුදල් වෙත ආදායම් මාරු කිරීම් රඳවා ගත් ඉපැයීම්වලින් මාරු කිරීමක් ලෙස ස්කන්ධ ප්‍රකාශනයේ ඉදිරිපත් කළ යුතුය. තවද, සිදු කළ යුතු යම් ගැලපීම් තිබේ නම්, 2025 වර්ෂයේදී ඒ අනුව ගැලපීම් කරනු ඇත.	අදාළ ආදායම් පමණක් ආදායම් ප්‍රකාශනයට හඳුනාගත යුතුය.

(එ)	වර්ෂ හතරකට පෙර විවිධ ව්‍යාපෘතිවලින් ලද රු. මිලියන 379.6 ක උපදේශන ගාස්තුව ගෙවිය යුතු උපදේශන ගාස්තුවක් ලෙස හඳුනාගෙන තිබූ අතර එය 2024 දෙසැම්බර් 31 දිනට පියවා හෝ ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි.	අදාළ පාර්ශවයන් සමඟ අඛණ්ඩ සාකච්ඡාවලින් පසුව, මෙම ගිණුම නිරවුල් කරනු ඇත.	ශේෂයන් වහාම පියවිය යුතුය.
(ඒ)	වාර්ෂික සත්‍යාපනයේදී සමහර ඉඩම්වල පැවැත්ම සත්‍යාපනය කිරීමට නොහැකි වීම හේතුවෙන් මණ්ඩලයේ වත්කම් වටිනාකම රු. මිලියන 86.16 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, වත්කම් ලේඛනයේ සටහන් කර ඇති ඉඩම් සහ ඉඩම් අංශය විසින් පවත්වාගෙන යනු ලබන ඉඩම් ලේඛනය අතර ඉඩම් කැබලි 521 ක වෙනසක් හඳුනා ගන්නා ලදි.	විස්තර සොයමින් පවතී. නිවැරදි ඉඩම හඳුනාගත් පසු, මෙම අගය නිවැරදි කරනු ඇත.	ඉඩම හඳුනාගෙන නිවැරදිව වාර්තා කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ඔ)	රු. මිලියන 170.45 ක් වටිනා වත්කම් ද්විගණනය කර තිබූ අතර එම වත්කම්වලට අදාළ වර්ෂය තුළ ක්ෂයවීම් රු. මිලියන 4.51 ක් විය. එබැවින්, මණ්ඩලයේ වත්කම්වල වටිනාකම රු. මිලියන 165.93 කින් වැඩියෙන් දක්වා තිබූ අතර වර්ෂයේ ලාභය රු. මිලියන 4.51 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ගිණුම් පරීක්ෂා කර ඒ අනුව ගැලපීම් කිරීමට කටයුතු කරමින් පවතී.	වත්කම් ද්විගණනය වීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.
(ඕ)	එකතුව රු. මිලියන 192.18 ක් වූ සින්නක්කර ගොඩනැගිලි, ව්‍යුහයන්, යටිතල පහසුකම්, පරිගණක හා අනෙකුත් උපකරණ, සමීක්ෂණ උපකරණ, ජංගම උපකරණ ක්‍රියා විරහිතව සහ භාවිතා කළ නොහැකි විය. කෙසේ වෙතත්, එම වත්කම්වලට අදාළව රු. මිලියන 85.08 ක ලියා හරින ලද වටිනාකම සඳහා මූල්‍ය ප්‍රකාශනවල කිසිදු හානිකරණ ප්‍රතිපාදනයක් සිදු කර නොතිබුණි	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අනුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ක)	ජල සම්පාදන ව්‍යාපෘති හතරක් සඳහා ලබාගත් ණය සඳහා වාරික සහ පොලිය ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් පැහැර හරින ලද පොලිය ලෙස දරන ලද රු. මිලියන 347 කට සමාන මුදලක් ගිණුම්ගත කර නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා කෙරීගෙන යන වැඩ ශේෂය එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.	පහත සඳහන් හේතූන් මත ප්‍රමාද පොලිය ගිණුම්ගත කර නොමැත. HNB - HNB මේ දක්වා දඩ පොලිය ඉල්ලා නොමැත.	ගිණුම්කරණ කාලපරිච්ඡේදයට අදාළ සියලු වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුය.

(ග)	හානිකරණ ගණනය කිරීමේදී රු. මිලියන 290 ක් වූ වෙළඳ ණයගැතියන් සහ ණයගැති පාලන ගිණුමේ රු. මිලියන 4,779 ක ශේෂයක් සලකා බලා නොතිබුණි. එබැවින්, හානිකරණයේ නිරවද්‍යතාවය තහවුරු කළ නොහැක.	වාණිජ පද්ධතිය විසින් ලබා දුන් තථ්‍ය සංඛ්‍යාලේඛන මත පදනම්ව හානිකරණ ගණනය කිරීම සිදු කරන ලදි. වාණිජ පද්ධතිය සහ පොදු ලෙජර් පද්ධතිය එකිනෙකට වෙනස් අරමුණු ඉටු කිරීම සඳහා පිහිටුවා ඇත. එබැවින්, මෙම පද්ධති දෙක අතර වෙනසක් ඇත.	හානිකරණ ගණනය කිරීමේදී සියලුම ණයගැති ශේෂයන් සලකා බැලිය යුතුය.
(ච)	වර්ෂ දාහතරක් තිස්සේ කිසිදු චලනයකින් තොරව කෙරීගෙන යන වැඩ ශේෂයට ඇතුළත් කර ඇති ව්‍යාපෘති පහක (05) එකතුව රු. මිලියන 198.72 ක් මත ඇති කරන ලද හානිකරණ බලපෑම හඳුනා ගැනීම සඳහා හානිකරණ පරීක්ෂණයක් සිදු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘති තවමත් ක්‍රියාත්මක කරමින් පවතින අතර, අදාළ ව්‍යාපෘති යටතේ සම්පූර්ණ කරන ලද සහ භාවිතා කළ හැකි වත්කම් ප්‍රාග්ධනීත කිරීමට ගණකාධිකාරීවරුන්ට උපදෙස් දී ඇත.	භාවිතයට නොගත් වත්කම් සඳහා හානිකරණ පරීක්ෂණයක් පැවැත්විය යුතුය.
(ජ)	HDFC හි ආයෝජනය කරන ලද කොටස්වලට අදාළව නැවත තක්සේරු කරන ලද රු. මිලියන 5.8 ක්, ආයෝජනයේ ස්වභාවය දිගු කාලීන වුවද 2024 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙටි කාලීන ආයෝජනයක් ලෙස ඉදිරිපත් කර තිබුණි. එබැවින්, ජංගම වත්කම් එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි. තවද, කාර්ය මණ්ඩල ණය සඳහා HDFC ආයෝජනයක් ලෙස ආයෝජනය කරන ලද රු. 434,368 ක මුදලෙහි පැවැත්ම, තොරතුරු නොමැති වීම නිසා තහවුරු කර ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත්, මධ්‍යම තැන්පතු පද්ධතියෙන් තහවුරු කිරීමක් නොලැබුණු අතර 2024 දෙසැම්බර් 31 වන දිනට පවතින ශේෂය තහවුරු කිරීම සඳහා සමාගම් ලේකම්ගෙන් තහවුරු කිරීමක් පමණක් ලැබී තිබුණි.	HDFC හි ආයෝජනය කාර්ය මණ්ඩල ණයක් සඳහා වන අතර එය කොටස් හිමිකමක් නියෝජනය නොකරයි. ණය සම්පූර්ණයෙන් අයකර ගැනීමෙන් පසු, HDFC විසින් මණ්ඩලය වෙත මුදල ආපසු ගෙවිය යුතුය.	ආයෝජනයේ ස්වභාවය හඳුනාගෙන ඒ අනුව ඉදිරිපත් කිරීම කළ යුතු අතර ආයෝජන මුදල තහවුරු කර ගැනීමට ඉදිරිපත් කල යුතුය.
(ට)	UDA ව්‍යාපෘතිය - ADB ණය ලෙස දක්වා තිබූ රු. මිලියන 20.71 ක මුදල සඳහා සාක්ෂි ලැබී නොතිබුණි. එබැවින්, මෙම ණය මුදලේ පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය.	නාගරික සංවර්ධන අධිකාරියෙන් පැහැදිලි කිරීමක් ලබා ගැනීමෙන් පසු අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.	වගකීමේ පැවැත්ම හඳුනාගෙන ඒ අනුව ගැලපීම් කළ යුතුය. ඒ සඳහා සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.
(ඩ)	මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා ණය අංක 3348 යටතේ රජයෙන් ලබාගත් රු. මිලියන 11,011.54 ක උප ණය, පරිශීලකයින්ගේ තේරුම් ගැනීම සඳහා උප ණය ලෙස නිසි ලෙස වර්ගීකරණය කර නොතිබුණි. මෙම ණය සම්බන්ධයෙන්	මෙය රජය විසින් ලබාගත් ණයක් වන අතර එය ජනරජ ගිණුම්වල සටහන් කර ඇති අතර විදේශීය ප්‍රදානවල ගනුදෙනු පදනම මත මණ්ඩලයේ ප්‍රදාන ලෙස ගිණුම්ගත කර ඇත.	ණය වගකීමේ ස්වභාවය අනුව ණය වර්ගීකරණය කළ යුතුය.

	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් සහ ජනරජ ගිණුම්වල දැක්වෙන ශේෂයන් අතර රු. මිලියන 6,568 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, යාපනය කිලිනොච්චි ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා ලබාගත් රු. මිලියන 5,626 ක ණය (ණය අංක 3603 සහ 3604) උප ණය ගිවිසුමක් තිබුණද උප ණයක් ලෙස සටහන් කිරීම වෙනුවට භාණ්ඩාගාරය නිරවුල් කළ ස්කන්ධයට පරිවර්තනය කළ හැකි ණය ලෙස වර්ගීකරණය කර තිබුණි.		
(න)	ජල සැපයුම් ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා ගත් රු. මිලියන 26,511 ක් වූ ණය, භාණ්ඩාගාරය නිරවුල් කළ ස්කන්ධයට පරිවර්තනය කළ හැකි ණය යන මාතෘකාව යටතේ ගෙවිය යුතු ණය ලෙස සටහන් කර තිබුණි. එබැවින්, ණය ශේෂය රු. මිලියන 26,511 කින් වැඩියෙන් දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කරනු ඇත.	ලැබුණු ස්වභාවය අනුව ණය වර්ගීකරණය කිරීම.
(ණ)	ප්‍රධාන කාර්යාලය විසින් ලබා දුන් මුදල් අග්‍රිම මත ව්‍යාපෘතිය විසින් සිදු කරන ලද ගනුදෙනු වාර්තා නොකිරීම හේතුවෙන් මුදල් සහ මුදල්වලට සමාන දෑ හි ශේෂය රු. මිලියන 2,352 කින් වැඩියෙන් දක්වා තිබුණි.	2025 වර්ෂය තුළදී අදාළ ව්‍යාපෘති මගින් ජර්නල් සටහන් ඉදිරිපත් කළ පසු අග්‍රිම ශේෂ පියවනු ඇත.	මුදල් අග්‍රිම හරහා සිදු කරනු ලබන වියදම් නිශ්චිත කාල සීමාව තුළදී පියවිය යුතුය.
(ත)	සම්පූර්ණ කරන ලද GCWWMIIP - ව්‍යාපෘතිය 1 ව්‍යාපෘතියට අදාළව ගෙවන ලද පොලිය, ආදායම් ප්‍රකාශයට අය කිරීම වෙනුවට ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන්, කෙරීගෙන යන වැඩ ශේෂය සහ වර්ෂයේ ලාභය රු. මිලියන 63.13 කින් වැඩියෙන් දක්වා තිබුණි.	ව්‍යාපෘතිය තවමත් ක්‍රියාත්මක කරමින් පවතී. එබැවින්, ගෙවන ලද පොලිය ඒ අනුව අය කරන ලදි.	ව්‍යාපෘතිය අවසන් කර ඇති බව තහවුරු කර ඇති බැවින්, ගෙවන ලද පොලිය ආදායම් ප්‍රකාශනයට අය කළ යුතුය.
(ද)	සංකල්පීය රාමුවේ 4.15 ඡේදයේ අවශ්‍යතාවය අනුව මාතර අදියර IV ව්‍යාපෘතියට අදාළව රු. මිලියන 1,208 ක වන්දි ගෙවීම සඳහා මණ්ඩලය විසින් ප්‍රතිපාදන සැලසිය යුතු වුවද, සටහන අංක 36 හි අසම්භාව්‍ය වගකීම් ලෙස හෙළිදරව් කිරීම පමණක් සිදු කර තිබුණි. එබැවින්, ලාභය එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.	අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයට අනුව, රජය විසින් වගකීම පියවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත. අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ ප්‍රතිඵලය මත පදනම්ව, අවශ්‍ය ක්‍රියාමාර්ග 2025 මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරනු ඇත.	ලාභය නිවැරදි කල යුතුය.

(ද)	2023 වර්ෂයට අදාළව රු. මිලියන 498.47 ක ආයුගණක තක්සේරු අලාභය වත්මන් වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ගැලපීම් කර තිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම එම අගයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි. තවද, ආයුගණක තක්සේරුකරණයේදී ගෙවන ලද පාරිතෝෂික මුදල සලකා නොබැලීම හේතුවෙන් විස්තීර්ණ ආදායම සහ ලැබිය යුතු ශේෂය රු. මිලියන 16.5 බැගින් වැඩියෙන් දක්වා තිබුණි.	ආයුගණක තක්සේරුව ස්වාධීන බාහිර විශේෂඥයෙකු විසින් සිදු කරන ලද අතර, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සියලු ගැලපීම් විශේෂඥයාගේ නිර්දේශ මත පදනම්ව සිදු කරන ලදි. ඒ අනුව, ආයුගණක අලාභය ගැලපීම් කිරීම, තක්සේරු වාර්තාවේ සපයා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූල විය.	අදාළ කාල පරිච්ඡේදයේ වියදම් නිසි ලෙස හඳුනාගත යුතුය අතර ඒ අනුව ගිණුම් නිවැරදි කල යුතුය.
(න)	2024 වර්ෂයේදී නැවත අයකර ගැනීමේ වැඩවලින් ලාභය හඳුනා ගැනීම වෙනුවට, පාරිභෝගිකයින් විසින් ලබා දුන් නැවත අයකර ගැනීමේ වැඩ සඳහා අත්තිකාරම්වලින් රු. මිලියන 9.164 ක් වෙනත් මෙහෙයුම් ආදායම් සහ ලාභ ලෙස මණ්ඩලය විසින් ආදායම් ප්‍රකාශනයට අය කර තිබුණි. මෙම නැවත අයකර ගැනීමේ වැඩ සඳහා අදාළ වියදම්, මණ්ඩලය විසින් ගැලපුම් සංකල්පය යෙදීමෙන් තොරව පෙර වර්ෂයේ ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගෙන තිබුණි.	නැවත අයකර ගැනීමේ ව්‍යාපෘති සඳහා යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීමට කටයුතු සිදු කරමින් පවතී.	අදාළ කාලපරිච්ඡේදය සඳහා ආදායම හඳුනාගත යුතුය.
(ප)	කෑගල්ල සැලසුම් අංශයේ ගබඩාවේ තබූ රු. මිලියන 19 ක් වටිනා පයිප්ප සඳහා පාඩුව වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. එබැවින්, කෙරීගෙන යන වැඩ ශේෂය එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.	නිර්දේශ මත පදනම්ව තොග හිඟයන්ට අදාළ සවිස්තරාත්මක පරීක්ෂණ සිදු කරමින් පවතින අතර ශේෂයන් අයකර ගැනීම සිදු කරනු ඇත.	විමර්ශනය මත පදනම්ව ගිණුම්වල අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතු අතර පාඩුව පියවා ගත යුතුය.
(බ)	පියවීමෙන් තොරව නොසැසඳූ අන්තර් ප්‍රාදේශීය ජංගම ගිණුම් ශේෂය වූ රු. මිලියන 35.23 ක් වෙළඳ සහ ලැබිය යුතු මුදල් හි ඇතුළත් කර තිබුණි. එබැවින්, වෙළඳ සහ ලැබිය යුතු ශේෂය එම අගයෙන්ම වැඩියෙන් දක්වා තිබුණි.	අදහස් දැක්වීම් ලැබී නොතිබුණි.	ජංගම ගිණුම් සඳහා වරින් වර සැසඳීම් සිදු කළ යුතු අතර ඒ අනුව ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදු කළ යුතුය.

1.5.4 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැට් බදු වාර්තා සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මනුගත විකුණුම්වල වටිනාකම, තොග විකුණුම්, බවුසර් සැපයුම සහ ප්‍රධාන මෙහෙයුම් ආදායම අතර රු. මිලියන 1,264 ක නොසැසඳූ වෙනසක් නිරීක්ෂණය විය.	ආදායම් කාණ්ඩ වෙනස්කම්, ආදායම් හඳුනාගැනීමේ වෙනස්කම් සහ සැකසුම් පරතරය (කාල වෙනස්කම්) වැනි විවිධ හේතූන් මත වෙනස්කම් සිදුවිය හැකිය. සමහර ආදායම් කාණ්ඩ සඳහා වැට් බදු අය නොකිරීම ආදිය.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වෙනස්කම් හඳුනා ගැනීම සඳහා සැසඳීම් සිදු කළ යුතුය.

(ආ)	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් අදාළ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සමඟ සසඳන විට, එක් විදේශ අරමුදල් සපයන ව්‍යාපෘතියක විදේශ ප්‍රාග්ධන ප්‍රදානවල එකතුව රු. මිලියන 385 ක වෙනසක් නිරීක්ෂණය විය.	වෙනස රු. 8,865,521,372.15 සිට රු. 1,478,646,399.59 දක්වා අඩු වී ඇත.	වෙනස්කම් හඳුනා ගැනීම සඳහා සැසඳීම සිදු කළ යුතු අතර වෙනස්කම් සඳහා ගැලපීම් සිදු කළ යුතුය.
(ඇ)	මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන කෙරීගෙන යන වැඩ ශේෂය සහ විදේශීය අරමුදල් සපයන ව්‍යාපෘති තුනක ඒ ඒ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූප ශේෂයන් අතර එකතුව රු. මිලියන 658 ක වෙනසක් නිරීක්ෂණය විය.	එම ශේෂවල වෙනස හඳුනාගෙන තිබුණි.	වෙනස්කම් සඳහා හේතු හඳුනාගැනීම සඳහා නිසි ලෙස සැසඳීම සිදු කළ යුතු අතර වෙනස්කම් සඳහා ගැලපීම් සිදු කළ යුතුය.
(ඇ)	ප්‍රාග්ධන දායකත්වයට අදාළව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය සහ මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂය අතර රු. මිලියන 15,192 ක වෙනසක් නිරීක්ෂණය විය.	2014 වර්ෂයේදී ස්කන්ධය ලෙස පරිවර්තනය කරන ලද ණය ලබා ගැනීම්, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල රජයේ ස්කන්ධය ලෙස අඛණ්ඩව දක්වා ඇත. එබැවින්, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල සහ මහා භාණ්ඩාගාරයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ප්‍රාග්ධන දායකත්වයේ වෙනසක් පෙන්නුම් කෙරේ.	වෙනස්කම් හඳුනාගෙන ඒ අනුව ගැලපීම් කළ යුතුය.
(ඉ)	මූල්‍ය ප්‍රකාශනවල සහ වාණිජ මෙහෙයුම් කළමනාකරණ පද්ධතියේ දැක්වෙන ණයගැති ශේෂයන් අතර රු. මිලියන 4,648.88 ක නොසැසඳූ වෙනසක් නිරීක්ෂණය විය. තවද, 2024 දෙසැම්බර් 31 දිනට ණයගැති එකතු කිරීමේ පාලන ගිණුමේ රු. මිලියන 4,779 ක් නිරවුල් කිරීමෙන් තොරව පැවතුනි.	වාණිජ පද්ධතිය සහ පොදු ලෙජර් පද්ධතිය එකිනෙකට වෙනස් අරමුණු ඉටු කර ගැනීම සඳහා පිහිටුවා ඇත. එබැවින්, මෙම පද්ධති දෙක අතර වෙනසක් ඇත.	වෙනස්කම් හඳුනාගෙන ඒ අනුව ගැලපීම් කල යුතු අතර ණයගැති පාලන ගිණුම නිරවුල් කල යුතුය.

1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මුදල රු. මිලියන	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අනෙකුත් ණයගැතියන්	77.99	විස්තරාත්මක උපලේඛණ (217 සහ 219)	මෙම ශේෂයන් අනාගතයේදී විසඳනු ඇත.	සාක්ෂි සඳහා විස්තර ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය.
(ආ)	රඳවා ගැනීමේ බදු – 2024	30.27	රඳවා ගැනීමේ බදු සහතික	ඉදිරිපත් කර ඇත.	-එම-
(ඇ)	භාණ්ඩාගාර ප්‍රදාන(363) ප්‍රාග්ධන ප්‍රදාන - පළාත් පාලන ආයතන (364) විදේශ ප්‍රාග්ධන ප්‍රදාන (365)	146,651 1,409.92 8,611.82	එක් එක් ව්‍යාපෘතියට අදාළ විස්තර	පිළිතුරු දී නොමැත.	-එම-
(ඈ)	බැංකු ශේෂ (බැංකු ගිණුම් 52)	925	එක් එක් ශේෂය සඳහා බැංකු තහවුරු කිරීම.	බැංකු ශේෂය තහවුරු කිරීමේ ඉල්ලීම් ලිපි දැනටමත් අදාළ බැංකු වෙත යවා ඇත.	-එම-

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වෙළඳ ණයගැතියන්, නව සම්බන්ධතා ණයගැතියන්, මලාපවහන ණයගැතියන් සහ අනෙකුත් ණයගැතියන්ගෙන් එකතුව රු. මිලියන 4,409 ක් වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවතුනි. තවද, ඒ අතරින්, පාසල් කාණ්ඩයෙන් රු. මිලියන 440 ක් අයකර ගැනීමෙන් තොරව පවතී. මුළු හිඟ මුදලින් එකතුව රු. මිලියන 1,995 ක් විසන්ධි කරන ලද වෙළඳ ණයගැතියන්ගෙන් වර්ෂයකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවතුනි. විසන්ධි කර මාස 3 ක් ගතවී තිබුණද, අංක 12/2015 දරන මණ්ඩල චක්‍රලේඛයේ අවශ්‍යතාවයන්ට අනුව විසන්ධි කරන ලද ණයගැතියන්ගේ හිඟ ශේෂය අතරින් රු. මිලියන 922 කට එරෙහිව මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි.	පවතින නීතිරීති සහ රෙගුලාසි යටතේ නීත්‍යානුකූලව අඛණ්ඩව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. කෙසේ වෙතත්, ණයගැතියන් එකතු කිරීමේදී සමහර ප්‍රායෝගික ගැටළු මතු වේ.	අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුව ණය ගැතියන්ගෙන් හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතු අතර, එම ශේෂයන් අයකර ගැනීමට පවතින ක්‍රියා පටිපාටිය අනුගමනය නොකරන සේවකයින්ට එරෙහිව කටයුතු කළ යුතුය.

	නව සම්බන්ධතා ණයගැතියන් වාරික 3 කින් අයකර ගැනීමට නියමිතව තිබුණද, රු. මිලියන 27.84 ක් වසරකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවතුනි. ඉහත ශේෂය අතරින් පාර්ලිමේන්තු සමාජිකයින්ගේ රජයේ නිවාස සඳහා ලබා දුන් ජල සම්බන්ධතා 06 ක් සම්බන්ධයෙන් රු. මිලියන 1.8 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අයකර ගැනීමෙන් තොරව දිර්ඝ කාලීනව හිඟව පැවතුනි.		
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව, ක්‍රියාකාරී නොවන හිටපු සේවකයින්ට ලබා දුන් රු. මිලියන 16.9 ක ණය සහ අත්තිකාරම් වර්ෂ 13 කට වැඩි කාලයක් තිස්සේ ගිණුම්වල පැවතුනි. කෙසේ වෙතත්, ණය සහ අත්තිකාරම් ලබාගෙන තිබූ ඉහත සේවකයින්ගෙන් සියයට 90 කට වැඩි පිරිසකට නියමිත මුදල් අයකර ගැනීමෙන් තොරව විශ්‍රාම යාමට ඉඩ දී තිබුණි.	මානව සම්පත් කළමනාකරණ සහ මූල්‍ය අංශයේ ශේෂයන් සැසඳීමට කටයුතු කරමින් පවතී.	අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල අයකර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ඇ)	බාහිර ආයතනවල තැන්පත් කර තිබූ එකතුව රු. මිලියන 75 ක් වූ ආපසු ගෙවිය හැකි කෙටි කාලීන තැන්පතු වර්ෂ තුනක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුනු අතර අදාළ ලියකියවිලි නොමැති වීම හේතුවෙන් එයින් රු. මිලියන 11.95 ක් අයකර ගත නොහැකි වී තිබුණි. තවද, රේඛීය අමාත්‍යාංශයට ලබා දුන් රු. මිලියන 4.37 ක අත්තිකාරමක් වර්ෂ එකොළහක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව හිඟව පැවතුනි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා රේඛීය අමාත්‍යාංශයේ වගකීම් ප්‍රකාශයේ එය දක්වා නොතිබූ බැවින්, මෙම අත්තිකාරම අයකර ගැනීමේ හැකියාව සැක සහිත වේ.	මෙම මුදල්වලින් සමහරක් 2017 පෙබරවාරි මාසයේදී මාර්ග සංවර්ධන අධිකාරියට ආපසු ගෙවිය හැකි තැන්පතුවක් ලෙස ගෙවා තිබුණි. මෙම තැන්පතුව අයකර ගැනීම සඳහා 2022 වර්ෂයේදී මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දෙන ලද නමුත් මෙතෙක් කිසිදු පියවීමක් සිදු කර නොමැත. එබැවින්, මාර්ග සංවර්ධන අධිකාරියට අනාගතයේදී කරනු ලබන ගෙවීම්වලදී මෙය අයකර ගැනීමට කටයුතු සම්පාදනය කරනු ඇත.	තැන්පතු සහ අත්තිකාරම්වල පැවැත්ම සමාලෝචනය කිරීමට සහ අයකර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට වහාම පියවර ගත යුතුය.

1.6.2 අත්තිකාරම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ලෙජර් කේත අංක 246/0 යටතේ ලබා දී තිබූ රු. මිලියන 1,710 ක කොන්ත්‍රාත් අත්තිකාරම්වලින් රු. මිලියන 364.71 ක් වර්ෂ තුනකට වැඩි කාලයක් තිස්සේ පියවා ගැනීමෙන් තොරව පවතී. එම අත්තිකාරම්වල අයකර ගැනීමේ හැකියාව හඳුනා ගැනීම සඳහා	මූල්‍ය අර්බුදය හේතුවෙන් එම ව්‍යාපෘතිවල ප්‍රගතිය මන්දගාමී වූ අතර IPC තවමත් නිදහස් කර නොමැත. එබැවින්, කොන්ත්‍රාත් අත්තිකාරම් තවමත් අයකර ගැනීමෙන් තොරව පවතී.	අත්තිකාරම් අයකර ගැනීමට පියවර ගත යුතු අතර වගකිවයුතු නිලධාරීන්ගේ නොසැලකිලිමත්කම නිසා සිදුවන යම්

	රු. මිලියන 9.8 ක් වටිනා අත්තිකාරම් සඳහා ගොනු කර ඇති නඩු හය පිළිබඳව විගණනය සඳහා කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි. තවද, කාර්ය සාධන බැඳුම්කර නොමැති වීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකුට ලබා දී තිබූ රු. මිලියන 31 ක අත්තිකාරම් අයකර ගත නොහැකි අතර, හිඟ මුදල් පියවා ගැනීමට මණ්ඩලය විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.		පාඩුවක් රජයට බරක් නොවිය යුතුය.
(ආ)	වර්ෂ 5 කට පෙර අත්තිකාරම් ලබා දී ඇතත්, ප්‍රාදේශීය ලේකම්ට ගෙවන ලද රු. මිලියන 76 ක ඉඩම් අත්තිකාරම් මුදල පියවීමට මධ්‍යම ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානය (RSC) පියවර ගෙන නොතිබුණි. රු. මිලියන 72.27 ක වටිනාකම සඳහා විගණනය සඳහා ඉල්ලා තිබූ තොරතුරු RSC විසින් ඉදිරිපත් කර නොතිබුණි. සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති සඳහා ලබා දී තිබූ අත්තිකාරම් මාරු නොකිරීම හේතුවෙන් වත්කම් රු. මිලියන 3.8 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබා දී තිබූ රු. මිලියන 41.15 ක අත්තිකාරම් ලෙජර් කේතය 246 යටතේ කොන්ත්‍රාත්කරුට ලබා දී ඇති අත්තිකාරම් ලෙස සටහන් කර තිබූ අතර එය නිරවුල් කිරීමෙන් තොරව වර්ෂ 10 කට වැඩි කාලයක් තිස්සේ පැවතුනි. ඒ අතරින් රු. මිලියන 6.9 ක් ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කොන්ත්‍රාත්කරුවන්ගේ අත්තිකාරම් ගිණුමේ පැවතුනි.	මෙම මුදලට Greeted Kandy WSP විසින් ගෙවන ලද අත්තිකාරම් ඇතුළත් වන අතර මුළු මුදල RSC (මධ්‍යම) වෙත මාරු කර ඇත. ලබා දී ඇති මුදලින් ආවරණය වන ඉඩම් පිළිබඳ විස්තර දැන් හඳුනාගෙන ඇති අතර අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේ තත්ත්වය යාවත්කාලීන කිරීම සිදු කරමින් පවතී.	අත්තිකාරම් නිරවුල් කරගැනීමට කටයුතු කල යුතු අතර විගණනයට ඉල්ලූ තොරතුරු ලබාදිය යුතුය. අදාල ගිණුම්ද නිවැරදි කල යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
	(i) මු.රෙ. 104	2024 දෙසැම්බර් 31 දිනට පහත සඳහන් අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිවලට අනුකූලව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.		

(i)	මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයට ජලය සැපයීමේදී 2014 දෙසැම්බර් සිට 2024 සැප්තැම්බර් දක්වා කාලය තුළදී වැරදි කේතයක් යටතේ සම්බන්ධතා දෙකක් සඳහා බිල්පත් සැකසීම හේතුවෙන් රු. මිලියන 3.9 ක අලාභයක් සිදුවී තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	එම අලාභ අය කර ගැනීමට පියවර ගත යුතුය.
(ii)	රජයේ චක්‍රලේඛවලට පටහැනිව 2021 අගෝස්තු සිට 2024 මැයි දක්වා කාලය තුළදී සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය ඇතිව පමණක් හිටපු සභාපතිගේ පෞද්ගලික පරිශ්‍රයන් සඳහා ආරක්ෂක සේවාවක් සැපයීම හේතුවෙන් රු. මිලියන 5.8 ක අලාභයක් සිදුවී තිබුණි.	මණ්ඩලයේ හිටපු සභාපතිගේ වාචික උපදෙස් අනුව, අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් 2021.08.04 දිනැති ලිපියක් මගින් සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය ඇතිව ඔහුගේ කාර්යාලයට සහ පෞද්ගලික නිවසට ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු ලබා දෙන ලෙස ආරක්ෂක අධිකාරී වෙත දැනුම් දී ඇත. ඒ අනුව, ආරක්ෂක අධිකාරී විසින් ආරක්ෂක නිලධාරීන් දෙදෙනෙකු ලබා දීමට පියවර ගෙන ඇත. හිටපු සභාපතිගේ ධුර කාලය අවසන් වීමෙන් පසු, එම ආරක්ෂක නිලධාරීන් දෙදෙනා 2024 සැප්තැම්බර් මාසයේ සිට ඉවත් කර ඇත.	අලාභ අයකර ගැනීමට පියවර ගත යුතුය.
(iii)	සාමාන්‍යාධිකාරී සඳහා වෙන් කරන ලද වාහනය 2023 අප්‍රේල් 12 වන දින අනතුරට ලක්වී තිබුණද, වාහන අනතුරෙන් වූ රු. මිලියන 13 ක ඇස්තමේන්තුගත අලාභය 2023 දෙසැම්බර් 31 වන දිනට මහා භාණ්ඩාගාරයේ	රක්ෂණ සංස්ථාව සමඟ සාකච්ඡා කිරීමෙන් පසු, සියයට 50 ක අත්තිකාරම් ගෙවීමක් (රු. 2,999,975/=) ලැබී ඇත. අලුත්වැඩියාව අවසන් කර සුන්බුන් භාරදීමෙන් පසු ඉතිරි මුදල ගෙවනු ඇත.	ඇස්තමේන්තුගත මුදල සම්බන්ධයෙන් භාණ්ඩාගාරයට වාර්තා කල යුතුය.

		රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත මණ්ඩලය විසින් වාර්තා කර නොතිබුණි.		
(ආ)	මු.රෙ. 571	අදාළ පාර්ශව වෙත මුදා හැරීමකින් හෝ ආදායමට බැර කිරීමකින් තොරව රු. මිලියන 195.08 ක ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතු වර්ෂ දෙකකට වැඩි කාලයක් තිස්සේ පැවතුනි.	අදාළ පාර්ශවයන් විසින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ආපසු ගෙවිය හැකි ටෙන්ඩර් තැන්පතු නිදහස් කරනු ලැබේ. මෙම අවශ්‍යතාවය සපුරාලන තෙක් එම තැන්පතු පවතී.	ලංසුකරුවන්ට දැනුම් දී තැන්පතු නිදහස් කිරීමට පියවර ගත යුතුය. ඉතිරි නොපියවූ ශේෂයන් ආදායමට බැර කළ යුතුය.
(ඇ)	2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ රජය සතු ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොත			
	(i) 5.1 ඡේදය	එම විධිවිධානයට පටහැනිව, ඒකාබද්ධ අරමුදලට ලාභ ගෙවීමෙන් තොරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය යටතේ 2023 වර්ෂය සඳහා ප්‍රසාද දීමනාව වෙනුවට ඵලදායිතා දිරි දීමනාව ලෙස රු. මිලියන 286.76 ක මුදලක් ගෙවා තිබුණි. ඊට අමතරව සමාලෝචිත වර්ෂය තුළදී වැටුප සමඟ මාසික ඵලදායිතා දීමනාව ලෙස රු. මිලියන 444.60 ක මුදලක් සේවකයින්ට ගෙවා තිබුණි.	ඵලදායිතා මට්ටම් වැඩිවීම අනුව ඵලදායිතා දිරි දීමනා ගෙවන ලදි. ආදායම, එකතු කිරීම, NRW වැනි ඵලදායිතා නිර්ණායක ඇතුළත් සූත්‍රයකට අනුව මෙය ගණනය කර ඇත. උපයන ලද ලාභය සහ නිකුත් කරන ලද රජයේ චක්‍රලේඛ අනුව පමණක් ප්‍රසාද දීමනා ගෙවනු ලබයි. ඒ අනුව ප්‍රසාද දීමනා ගෙවා නොමැත.	මෙහෙයුම් අත්පොතට පටහැනිව කරන ලද ගෙවීම් අයකර ගත යුතුය.
	(ii) 6.2 ඡේදය	2024 වර්ෂයේදී ආයෝජන කමිටුව පිහිටුවන ලද නමුත්, සමාලෝචිත වර්ෂය තුළදී ආයෝජන තීරණ ගැනීමේදී එය ක්‍රියාකාරීව ක්‍රියාත්මක කර නොතිබුණි.	ආයෝජන කමිටුව පිහිටුවීමේදී කාර්යය පරාමිතීන් (TOR) ඇති අතර සාමාජිකයන් එම යොමු ගත කරුණු වලට අනුකූල වේ.	ආයෝජන කමිටුව සක්‍රීය කළ යුතුය.

(ඈ)	2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වූ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය			
	(i) 2.3 ඡේදය	2025-2029 කාලපරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්ම 2025 අප්‍රේල් දක්වා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සංයුක්ත සැලැස්ම අවසන් කිරීමේ අදියරේ පවතින අතර එය අවසන් කිරීමෙන් පසු ඉදිරිපත් කරනු ඇත.	සංයුක්ත සැලැස්ම වහාම ඉදිරිපත් කළ යුතුය.
	(ii) 4.3 ඡේදය	මාර්ගෝපදේශයට අනුව පිහිටුවන ලද අවදානම් කමිටුව සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර නොතිබුණි.	කමිටුව 2025 වර්ෂයේදී එහි කාර්යයන් දිගටම කරගෙන යාමට ආරම්භ කර ඇත. ඒ අනුව, 2025.05.15 දින කමිටු රැස්වීමක් පවත්වන ලදි.	මණ්ඩලය මුහුණ දෙන අවදානම් අවම කිරීම සඳහා කමිටු රැස්වීම් නිතිපතා ක්‍රියාත්මක කළ යුතුය.
(ඉ)	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2020 ජනවාරි 27 දිනැති චක්‍රලේඛ අංක පීඊඩී 01/2020 හි 1.2 ඡේදය	චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව, අනුයුක්ත කරන ලද වාහනය ඇතුළුව 2022 සිට 2024 සැප්තැම්බර් දක්වා සභාපති විසින් වාහන තුනක් සහ උප සභාපති විසින් වාහන දෙකක් භාවිතා කර තිබුණි. ධාවන සටහන්වලට අනුව 2024 වර්ෂය තුළදී සභාපති විසින් භාවිතා කරන ලද වාහනය මණ්ඩලයේ පරිශ්‍රයට ඇතුළු කර නොතිබූ අතර සභාපතිගේ භාවිතය සඳහා වාහනය ප්‍රසම්පාදනය කළ බව ලේඛනවල සඳහන් වුවත් අනෙත් වාහනය භාවිතා කිරීම පිළිබඳව තහවුරු කර ගැනීමට කිසිදු සාක්ෂියක් ලැබී නොතිබුණි.	වාහන ප්‍රතිපත්තියට අනුව මණ්ඩල ලේකම් කාර්යාලය සඳහා වාහන සපයා ඇත. තවද, WP-CAS-7557 අංකය දරන වාහනයක් මණ්ඩලය නමින් ලියාපදිංචි කර ඇති බවට ප්‍රවාහන අංශයේ කිසිදු වාර්තාවක් නොමැත.	චක්‍රලේඛයට අනුකූලව පවරා ඇති වාහනවලට අමතරව භාවිතා කරන ලද වාහන සම්බන්ධයෙන් පරීක්ෂාවක් සිදුකර රජයට සිදුවී ඇති පාඩු අයකර ගත යුතුය.
(ඊ)	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන චක්‍රලේඛය			
	(i) 3.2.1 ඡේදය	චක්‍රලේඛයට පටහැනිව, මණ්ඩලයේ සභාපති සහ උප	රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2024 හි 11.3	අලාභ අයකර ගැනීමට කටයුතු කළ

	සභාපති මසකට ලීටර් 145 ක් වෙනුවට අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව අසීමිත ඉන්ධන ප්‍රමාණයක් භාවිතා කර තිබුණු අතර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියෙන් තොරව 2021 ජනවාරි මාසයේ සිට සභාපති විසින් අතිරික්ත ලීටර් 9,652.92 ක් සහ 2022 ජනවාරි සිට 2024 අගෝස්තු දක්වා කාලය තුළදී උප සභාපති විසින් ලීටර් 11,853.25 ක් භාවිතා කර තිබුණි. තවද, උප සභාපතිට අනුයුක්ත කර තිබූ වාහනයක් 2022 සහ 2023 වර්ෂවලදී සාමාන්‍යාධිකාරීට සහ පාලක මණ්ඩලයට දැනුම් දීමකින් තොරව බාහිර පාර්ශවයක් විසින් භාවිතා කර තිබුණි. එම කාලය තුළදී වාහනය කිලෝමීටර් 13,698 ක් ධාවනය කර තිබුණි.	වගන්තියට අනුව සභාපති සඳහා අතිරේක ඉන්ධන සඳහා අනුමැතිය අමාත්‍යාංශ ලේකම්ගෙන් ලබාගෙන ඇත. සභාපතිගේ රාජකාරිවල ස්වභාවය නිසා, පූර්ව අනුමැතිය සැමවිටම ප්‍රායෝගික නොවන අතර, අනාගත අනුකූලතාව සඳහා මෙය සටහන් කර ගනු ලැබේ.	යුතුය.
(ii). 3.2.2 ඡේදය	(i) 2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා කාලය තුළදී මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරීවරුන් සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් විසින් රු. මිලියන 7.45 ක් වටිනා ඉන්ධන ලීටර් 23,313 ක් අතිරික්තව භාවිතා කිරීම සඳහා චක්‍රලේඛයේ අවශ්‍යතාවයට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයෙන් අනුමැතිය ලබාගෙන නොතිබූ අතර අතිරික්ත භාවිතය සඳහා දරන ලද වියදම සඳහා කිසිදු ප්‍රතිපූරණයක් 2025 අප්‍රේල් දක්වා සිදු කර නොතිබුණි. (ii) මහා භාණ්ඩාගාරයෙන් විශේෂ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව, 1990 වර්ෂයේ සිට කාර්යාල වේලාවෙන් පසුව සහ නිවාඩු දිනයන්හි අතිරේක සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ සහකාර	2024.03.21 දින අමාත්‍යාංශයේ පැවති රේඛීය අමාත්‍යාංශයේ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීමේදී මෙම කරුණ සාකච්ඡා කරන ලද අතර, අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් පරිදි, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු ඇතුළු මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් විසින් කරුණු අධ්‍යයනය කර, ලබා දී ඇති නිර්දේශ අනුව, චක්‍රලේඛවලට අනුකූලව නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට පියවර ගන්නා ලදි.	අලාභ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

		සාමාන්‍යාධිකාරීවරුන්ට සීමාවකින් තොරව කිලෝමීටරයකට රු. 2 සිට රු. 15 දක්වා වූ සහනදායී අනුපාත යටතේ පුද්ගලික භාවිතය සඳහා මණ්ඩලයේ වාහන භාවිතා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. එබැවින්, 2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා කාලය තුළදී සේවකයින් 13 දෙනෙකුගේ පුද්ගලික භාවිතය සඳහා භාවිතා කරන ලද ඉන්ධන ලීටර් 12,010 ක් සඳහා වැය කරන ලද රු. මිලියන 3.93 ක මණ්ඩලයේ අරමුදල් මණ්ඩලය විසින් අනිසි ලෙස භාවිතා කර තිබුණි. කෙසේ වෙතත්, පද්ධතිය විධිමත් කිරීමට පියවර ගෙන නොතිබුණු අතර අතිරික්ත භාවිතය සඳහා දරන ලද වියදම සඳහා කිසිදු ප්‍රතිපූරණයක් 2025 අප්‍රේල් දක්වා සිදු කර නොතිබුණි.		
(උ)	2012 දෙසැම්බර් 24 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 49 සහ 2012 ජනවාරි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය.	2012 වර්ෂයේ සිට මණ්ඩලය විසින් සේවකයින් සමඟ සාමූහික ගිවිසුම්වලට එළඹීමකින් තොරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පදනම්ව වැටුප් ගෙවා තිබුණි.	මේ සම්බන්ධයෙන් වෘත්තීය සමිති සමඟ සාකච්ඡා පවත්වමින් පවතී.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛවල අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.
(ඌ)	ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වාණිජ මාර්ගෝපදේශයේ 1.4 ඡේදය	නව සම්බන්ධතාවය ලබා දුන් දින සිට දින 30 ක් ඇතුළත පළමු ජල බිල්පත පාරිභෝගිකයාට නිකුත් කළ යුතුය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන දිනට අවස්ථා 230 කදී පළමු බිල්පත ලබා දීමේදී දින 180 කට වැඩි ප්‍රමාදයක් නිරීක්ෂණය විය.	කොන්ත්‍රාත්කරුවන් විසින් සපයන ලද තොරතුරු ලබා දීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇති බව සොයාගෙන ඇත. කෙසේ වෙතත්, ජල සැපයුමෙන් දින 30 ක් ඇතුළත ජල බිල්පත් ලබා දීමට උත්සාහ	පළමු ජල බිල්පත වාණිජ මාර්ගෝපදේශයට අනුව නිකුත් කළ යුතුය.

කරන අතර පසු විපරම් කටයුතු සිදු කරනු ඇත.

1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
